# ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනයා පිළිබඳ මානවවංශ විද්‍යාත්මක අධ්‍යයනයක්

(බළලු වැව අහිකුණ්ඨික වාඩිය පිළිබඳ විශේෂ අධ්‍යයනයක්)

එච්.පී.එම්.ආර්.සී. පතිරාජ

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
chathurikaroshani94@gmail.com

ප්‍රමුඛ පදඃ අහිකුණ්ඨික, සංස්කෘතිය, වාඩිය, වැකන්ද

## හැඳින්වීම

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන කණ්ඩායම් අතර වැදි රොඩි, කින්නර, වැනි හුදකලා වූ ඔවුන්ටම ආවේණික වූ සංස්කෘතියක් සහ අනන්‍යතාවක් පවත්වගෙන යන ජන කණ්ඩායම් කිහිපයකි. ඒ අතරින් සුවිශේෂී ජන කණ්ඩායමක් ලෙස අහිකුණ්ඨික ජනයා හැඳින්විය හැකිය. නයි නැටවීම, සොරකම් කිරීම, සාස්තර කීම වැනි ජීවනෝපායන්වල යෙදෙන සංචාරක දිවියක් ගතකරන මෙම ජනයාගේ ප්‍රභවය සම්බන්ධයෙන් නිශ්චිත අදහසක් නොමැත. මොවුන්ගේ මුල් භූමිය ලෙස සැලකෙන්නේ ඉන්දියාවයි. ලංකාවේ සිටින අහිකුණ්ඨිකයන් මෙන්ම ලෝකයේ වෙනත් රටවල වෙසෙන අහිකුණ්ඨිකයන්ද දකුණු ඉන්දියාවේ සිටින කුර්වර් හෙවත් කෝරාව නම් ගෝත්‍රිකයන්ට අතිශයින් සමාන වන බැවින් අහිකුණ්ඨිකයන්ගේ මුල් වාසභූමිය ලෙස ඉන්දියාව සලකනු ලබයි. අහිකුණ්ඨිකයන්ගේ ප්‍රභවය සම්බන්ධයෙන් විවිධ විද්වතුන් විසින් විවිධ මත පල කර තිබේ. ඒ අතරින් අහිකුණ්ඨිකයන්ගේ මුල් වාසභූමිය ඉන්දියාව බවට වාග් විද්‍යාඥයකු වන ඔගුස්ට් ප්‍රීඩ්ක් පොට් විසින් පෙන්වා දී ඇත. චාමන් ලාල් දක්වන්නේ අහිකුණ්ඨිකයන්ගේ මුල්ම භූමිය උතුරු හා වයඹ දිග ඉන්දියාව බවයි. ඔවුන්ගේ මුතුන් මිත්තන් පන්ජාබ්, සින්ධ්, රාජ්පුතානා සහ මාල්වා දේශවාසී ආර්ය ජනයා ලෙස සැලකිය හැකි බව ඔහු පැහැදිලි කර තිබේ. සමහර උගතුන්ගේ මතය වන්නේ අහිකුණ්ඨිකයන් පැවතගෙන එන්නේ බටහිර හිමාලයට දකුණින් හා කුන්ලුන් කඳුවැටියට බටහිරින් පිහිටි කරකෝරම්හි කුඩාරම්වල වාසය කරන කරක්බිතන් නම් ගෝත්‍රවාසීන්ගෙන් බවයි. කෙසේ වුවද අහිකුණ්ඨිකයන්ගේ මුල් භූමිය ලෙස ඉන්දියාව සලකනු ලැබේ.

මෙම ජනයා හැඳින්වීම සඳහා විවිධ නාමයන් භාවිත වේ. ඒ අතරින් පැරණි සංස්කෘත සහ පාලි සාහිත්‍යයන්හි **අහිගුණ්ඩික**, **කුණ්ඩික** හා **ආහිතුණ්ඩික** යන්නෙන් හඳුන්වා ඇත. ඇමරිකාවේ **රාජ්පුත්**, එංගලන්තයේ **ජිප්සීස්**, ස්පාඤ්ඤයේ **ගිටානෝස්** ආදී වශයෙන් විවිධ රටවල විවිධ නාමයන්ගෙන් මීට සමාන ජන කොටස් හඳුන්වනු ලබයි.

අහිකුණ්ඨිකයන්ගේ ප්‍රධාන ගෝත්‍ර ප්‍රභේද දෙකකි. එනම් **මද්දිලියන්** සහ **වඩුගයන්ය**. මද්දිලියන් යනු රිලා නටවන්නන්ය. මොවුන් රිලා පනික්කියන් ලෙෂ ද හඳුන්වනු ලබයි. අනෙක් ප්‍රභේදය වන්නේ වඩුගයන්ය. මොවුන් නයි නටවන්නන් ලෙසත් නයි පනික්කියන් ලෙසත් හඳුන්වනු ලබයි. මෙම ප්‍රභේද

දෙකට අමතරව පරම්පරාවෙන් පැවත එන ගෝත්‍ර ප්‍රභේද දෙකකි. එනම් දුගුදුරු සහ තපලොරු වශයෙනි. මෙම ජනයාගේ ප්‍රධාන ජීවනෝපාය වන්නේ පිරිමින් නයි සහ රිලවුන් නැටවීමත් කාන්තාවන් සාස්තර කීමත්ය. ලාංකීය අහිකුණ්ඨික ජනයා වර්තමානය වන විට ඉතා සීමිත ජන කණ්ඩායමකට පමණක් සීමා වී ඇත. උතුරු මැද, නැගෙනහිර, සබරගමුව, වයඹ යන පළාත්වල මොවුන්ගේ සංචාරක ජීවිතයන් ද සීමා වී ඇත.

පර්යේෂණයේ මුඛ්‍ය අරමුණ ලෙස ශ්‍රී ලංකාවේ අහිකුණ්ඨික ජනයා පිළිබඳව අධ්‍යයනය කිරීමත් ඔවුන්ගේ සංස්කෘතික පරිණාමය හැඳිනගැනීමත් වේ. තව ද වර්තමාන අහිකුණ්ඨික ජනයාගේ ජීවන වෘත්තීන් හැඳිනගැනීමත්, ඔවුන්ගේ ජීවන රටාව අවබෝධ කර ගැනීමත් සෙසු අරමුණු ලෙස පෙන්වාදිය හැකි ය.

**ක්‍රමවේදය**

යථෝක්ත පර්යේෂණය සඳහා දත්ත රැස් කිරීමේ දී ප්‍රධාන වශයෙන් ක්‍රමවේද ලෙස

01 ක්ෂේත්‍ර නොවන ගවේෂණය (මූලාශ්‍ර අධ්‍යයනය)

02 ක්ෂේත්‍ර ගවේෂණය භාවිත කරන ලදි.

ක්ෂේත්‍රයට පිවිසීමට පෙර ක්ෂේත්‍ර නොවන ගවේෂණය සිදු කළ අතර ඒවායින් ලබා ගන්නා ලද තොරතුරු මත ක්ෂේත්‍ර ගවේෂණය සිදු කරන ලදි. මෙම අධ්‍යනයේදී රැස් කරගන්නා වූ දත්ත වාර්තාකරනය සඳහා ක්ෂේත්‍ර සටහන් හා ඡායාරූප භාවිතා කරන ලද අතර දත්ත රැස් කිරීමට සම්මුඛ සාකච්ඡාවද යොදා ගන්නා ලදි.

**ප්‍රතිඵල හා සාකච්ඡා**

අහිකුණ්ඨික ජනයා පිළිබඳ ව සිදු කරන ලද යථෝක්ත පර්යේෂණය සඳහා පාදක කර ගන්නා ලද්දේ බළලු වැව වැකන්ද පාමුලට වසරකට දෙවරක් පැමිණෙන අහිකුණ්ඨික ජනයා පිළිබඳව ය. අතීතයේ අහිකුණ්ඨිකයන් ඇළදොළ, ගංගා, වැව් ඉහත්තාව වැනි ස්ථානවල මොවුන් වාඩි තනාගනු ලබයි. මෙම ජන කොට්ඨාශය ජල පහසුව ඇති ස්ථානයක් ලෙස බළලු වැව වැකන්ද පාමුල තම වාඩිය තනාගෙන ඇත. සංස්කෘතික පරිණාමයකට ලක්ව ඇති මෙම අහිකුන්ඨිකයන් වර්තමානය වන විට ස්ථිර පදිංචියට හුරු වී ඇත. මෙයට හොඳම නිදසුනක් ලෙස කලාවැව දියවර ගම්මානය සහ රාජාංගනය කුඩාගම පෙන්වාදිය හැකි ය. නමුත් මෙම පර්යේෂණයට බඳුන් වූ අහිකුණ්ඨිකයන් සංචාරක දිවිය එලෙස ම පවත්වාගෙන යාමට කටයුතු කරයි. බවට හොඳම උදාහරණයකි. වර්ෂයේ මුල් භාගයේ එනම් ජනවාරි පෙබරවාරි මාසවල දී හා වර්ෂ අවසානයේ ඔක්තෝම්බර් නොවැම්බර් මාසවල දී වැකන්ද පාමුල වාඩි තනා ගන්නා මොවුන් පවුල් හයකින් සමන්විත වේ. එක් ඒක් පවුල් වෙන් වෙන්ව වාඩි තනා ගෙන ඇති අතර බළලු වැව තුළින් තම ජල අවශ්‍යතා සපුරා ගනු ලබයි.

ජනවාරි මාසයේ මුල් කාලයේ පාමිණ වාඩි තනා ගන්නා මොවුන් පෙබරවාරි අවසන් වනවිට එම ස්ථානයෙන් ඉවත් වී තම ග්‍රාමයට යන බව එහි සිටි සරෝජා නැමැති අහිකුණ්ඨික කාන්තාව පවසයි. (සාකච්ඡාව) අහිකුණ්ඨික වාඩිය පිළිබඳව විමර්ශනය කරන විට අතීතයේ අහිකුණ්ඨික වාඩිය තනාගනු ලබන්නේ ශක්තිමත්භාවයෙන් වැඩි තල් අතු තෝරාගෙන නාගයාගේ හැඩයටය. එම ස්ථානයෙන් ඉවත් වන විට එම තල් අතු ද ගෙන යනු ලබයි. නමුත් වර්තමානයේ පර්යේෂණයට බඳුන් වූ අහිකුණ්ඨිකයන් තම වාඩි සකස් කරගෙන ඇත්තේ පොල් අතු සහ ඉටිරෙදි යොදාගෙනය.

මුල් කාලයේ දී අහිකුණ්ඨිකයන් තම රැකියාව ලෙස පිරිමින් රිලවුන් හෝ නයි

නටවමින් ද කාන්තාවන් ගෙන්ගෙට යමින් සාස්තර කීමෙන්ද ජීවිකාව සරි කර ගත්හ. වර්තමානයේදී ඔවුන් ස්ථිර පදිංචියට හුරු වීමත් සමඟ වෙනත් රැකියාවන්ට යොමු වූ බවක් දැකගත හැකිය. ගොවිතැන් කිරීම සතුන් ඇති කිරීම සහ වෙනත් රැකියාවන් සඳහා ඔවුහු එසේ පෙළඹී සිටිති. එසේම පර්යේෂණයට බඳුන් කරන ලද අහිකුණ්ඨික ජනයා තම ජීවන වෘත්තිය ලෙස මිනිසුන් වැඩි වශයෙන් ගැවසෙන ස්ථානවලට ගොස් හඳුන්කුරු විකණීම සිදු කරයි. මොවුන්ගේ සංස්කෘතිය කොතරම් වෙනස්වීමකට ලක් වීද යත් රිලවුන් නැටවීම නයි නැටවීම මෙම නඩේ කිසිවෙක් සිදු නොකරන අතර අතීතයේ මෙන් වර්තමානයේ ජනතාව එවන් දේවල් නැරඹීමට ප්‍රියතාවයක් නොදක්වන හෙයින් එවනි රැකියාවන් නොකරන බව ද තොරතුරු විමසීමේ දී හෙළිවිය.

මොවුන්ගේ භාෂාව ද ලංකාවේ වෙසෙන අනිකුත් අහිකුණ්ඨිකයන් මෙන් තෙළිඟු භාෂාවය. සිංහල භාෂාව ඉතා හොඳින් කතා කරන අතර රහසින් යමක් කතා කරන්නට අවශ්‍ය වූ විට තෙලිඟු භාෂාවෙන් කතා කරයි. මෙම පිරිස පුත්තලමේ සිට පැමිණෙන බව ද ආරච්චි ඔවුන් සමඟ නොපැමිණෙන බවද මෙහි සිටින මුත්තුකුමාර් දක්වයි. ආරච්චි යනු අහිකුණ්ඨික රැහේ නායකයා ය. ලාංකේය මහ සංස්කෘතිය ඇතුළත තිබෙන උප සංස්කෘතීන් අතරින් එක් සංස්කෘතියක් ලෙස සැලකෙන අහිකුණ්ඨික සංස්කෘතිය අදවන විට පරිණාමයට ලක්ව පවතී.

බෞද්ධාගමට සහ කතෝලික දහමට නැඹුරු වීම, ස්ථිර පදිංචියට හුරුවීම, මහ සංස්කෘතියෙන් වන බලපෑම වැනි හේතු මත අහිකුණ්ඨික සංස්කෘතිය කෙමෙන් කෙමෙන් සමාජයෙන් වියැකී යයි. එවන් අවධියක තැනින් තැන ශේෂව පවත්නා සංචාරක දිවිය ගත කරන අහිකුණ්ඨික ජනතාව අතර කදිම නිදර්ශකයක් ලෙස බළලුවැව අහිකුණ්ඨික ජනයා පෙන්වාදිය හැකිය.

**ආශ්‍රිත ග්‍රන්ථ**


සෝමසුන්දර, දයානන්ද., බණ්ඩාර, මාදන හේරත්. (2009)***ශ්‍රී ලංකාවේ ප්‍රාථමික ජන සමාජ.*** කොළඹ 10: ඇස් ගොඩගේ සහ සහෝදරයෝ.

රණසිංහ, චන්ද්‍ර ශ්‍රී. (2003)***ලොව පැතිර වසන අහිකුණ්ඨිකයෝ.*** වැල්ලම්පිටිය: චතුර ප්‍රින්ටින් වර්ක්ස්.